

# සිරියාවේ හෙට දවස

ශ්‍රීලාල් සෙනෙවිරත්න..

සිරියාවේ සිදුවෙමින් පවතින බිහිසුණු මානව ඛේදවාචකය නිමාකරනු වස් ජාත්‍යන්තරයෙන් සිදුවූ සියලු මැදිහත්වීම් මේ වන විට ප්‍රතිපල රහිතව අවසන්ව ඇත්තේ අවාසනාවන්ත ලෙසිනි. වසර එකහමාරක් තිස්සේ දිග්ගැසෙමින් පවතින සිරියානු අර්බුධය මහත් ව්‍යසනයකින් තොරව නිමාවක් කරා ගෙන යා හැකිවෙතැයි ජාත්‍යන්තරය තැබූ සියලු විශ්වාසයන් බිඳ වැටී තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සිරියාව තුළ සිදුකළ සාම නිරීක්ෂණ කටයුතුද ඉකුත් 16දා සිට අත්හිටවනු ලැබුවේය.

'අරාබි වසන්තය' දේශපාලන කුණාටුවට සිරියාවද හසුවූයේ ඉකුත් වසර ආරම්භයේදීය. වසර හතලිහක් තිස්සේ සිරියාව පාලනය කරන ජනපති බසිර් අලි අසාද්ගේ පාලනයට එරෙහිව මුලින්ම ජනතා විරෝධතා මතුවෙද්දී ඔහු ජනමතයට කන්දෙන බව පෙන්නුවද දිගින් දිගටම විරෝධතාකරුවන්ට එරෙහිව හමුදා ප්‍රහාර එල්ල කරමින් විරෝධතා මර්ධනයට උත්සාහ දැරුවේය. එහි ප්‍රතිපලය ලෙස කෙටි කලකින්ම විරෝධතාකරුවන් අසාද්ගේ පාලනයට එරෙහිව සටන්කරන කැරලිකරුවන් බවට පත්වූ අතර රජයේ හමුදා සහ කැරලිකරුවන් අතර දිගින් දිගටම ගැටුම් ඇවිලිණි.

අරාබි වසන්තයට ගොදුරු වූ රටවල් බොහෙ-ාමයක ආණ්ඩු පෙරළා දේශපාලන වෙනසක් ඇතිකරගන්නට කැරලිකාර පාර්ශ්වයන් සමත් වුවද සිරියාවේ කැරලිකරුවන්ට එය කළ හැකි නොවීය. සිරියාවේ ප්‍රදේශ ගණනාවක සහ නගර බොහොමයක බලය අල්ලා ගන්නට විටෙක සිරියා කැරලිකරුවන් සමත් වුවද තවත් වටයකදී එම ප්‍රදේශ සිය ග්‍රහණයට ගන්නට රජයේ හමුදා සමත් වූහ. මෙලෙස දිග්ගැසෙමින් යන ප්‍රචණ්ඩ ක්‍රියා හමුවේ රට සිවිල් යුද්ධයක් කරා අවතීර්ණවීමෙන් වළක්වා ගැනීම සඳහා ජාත්‍යන්තරයෙන් සිදුවූ කැපී පෙනෙන මැදිහත්වීම වූයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය අරාබි ලීගය හා එක්ව සිරියාවට ඉදිරිපත් කළ සාම සැළැස්මය. එහි මූලික කොන්දේසිය වූයේ දෙපාර්ශ්වය අතර සිදුවන සටන් නැවැත්වීමය.

මැතිවරණ පවත්වා රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම ඇතුළු තවත් කාරණා ගණනාවක් ද සාම සැළැස්මට ඇතුළත් විය. අල් අසාද්ගේ රජය සහ කැරලිකරුවන් ඊට එකඟවූයෙන් පසුගිය අප්‍රේල් මාසයේ සිට සාම සැළැස්ම ක්‍රියාවට නැගුණි. එහි කටයුතු අධීක්ෂණය සඳහා විශේෂ සාම නියෝජිතයා ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම් කොෆි අනන් පත්කළ අතර සාම සැළැස්මේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය සඳහා ජාත්‍යන්තර නිරීක්ෂක කණ්ඩායමක් ද සිරියාවට එවනු ලැබීය.

එහෙත් අපේක්ෂා කළ අයුරින් සාම සැළැස්ම සාර්ථක වූයේ නැත. විශේෂයෙන්ම ඊට හේතුවූයේ ජනපති අසාද් විසින් වරින් වර සිය ස්ථාවරය වෙනස් කරමින් කැරලිකරුවන් රැවටීමය. අසාද්ගේ මේ ක්‍රියාකළාපය හේතුවෙන් ඔහු විසින් පවත්වන ලද මැතිවරණයද කැරලිකරුවන් හැඳින්වූයේ ප්‍රෝඩාවක් ලෙසටය.

සිරියාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් හමුදාමය මැදිහත්වීමක් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය කීප අවස්ථාවකම දරන ලද උත්සාහයන් චීනය සහ රුසියාවේ විරෝධතා හේතුවෙන් ව්‍යර්ථව ගියේය. සිරියාවේ අර්බුධය සිරියාව විසින්ම විසඳාගැනීමට ඉඩ දිය යුතුය යන්න චිනයේ සහ රුසියාවේ ස්ථාවරය විය. මේ අතර විශේෂ සාම නියෝජිත කොෆි අනන් ඉරානය ඇතුළු සෙසු අරාබි රටවල සහායද ලබාගෙන සිරියා අර්බුධයට විසඳුමක් සෙවීමට ගත් උත්සාහයන්ද අසාර්ථකවිය.



ජනාධිපති බෂීර් අල් අසාද්ගේ පාලනය සහ කැරලිකාර පාර්ශ්වය නියෙ-ා්ජනය කෙරෙන අන්තර් කාලීන සංක්‍රාන්ති රජයක් පිහිටුවීමට ජාත්‍යන්තරය යෝජනා කරන්නේ මේ සියලු උත්සාහයන් අසාර්ථකවීමෙන් අනතුරුවය. මුලින් ඊට කැමැත්තක් දැක්වුවද පසුව දෙපාර්ශ්වයම එය අතැර බලය සඳහා ගෙන යන සටන තව තවත් මාරාන්තික තලයකට ගෙන ආහ. ජනපති අසාද් රජයේ හමුදා යොදවා සිදුකරන ප්‍රහාර වඩාත් දැඩි කළේය. රජයේ හමුදාවල ප්‍රධාන ඉලක්කය වූයේ තමන්ට එරෙහි සටනේ නායකත්වය ගෙන කටයුතු කරන අබි මොහමඩිය. ඔහු සිටිනු ඇතැයි සැකකෙරෙන සෑම ප්‍රදේශයකටම රජයේ හමුදා බර අවි සහ ගුවන් ප්‍රහාර එල්ල කරනු ලැබූ අතර ප්‍රහාරවලින් සිය ගණනින් ජීවිතක්ෂයට පත්වූහ. එරටින් ලැබෙන වාර්තා අනුව එලෙස ජීවිතක්ෂයට පත් බහුතරය සිවිල් වැසියන්ය. එයින් ද වැඩි පිරිස කාන්තාවන් සහ ළමයින්ය. ඉකුත් ජූලි මාසය වන විට ගැටුම් බිහිසුණු අඩියකට පත්ව තිබිණ.

ජූලි 06 දා රජයේ හමුදා ඩරායා නුවරට එල්ල කළ ප්‍රහාරවලින් ජීවිතක්ෂයට පත් සංඛ්‍යාව 95කි. ඉන් සතියකට පසු හාමා ප්‍රාන්තයේ නගරයකට එල්ල කළ එවැනිම ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත් සංඛ්‍යාව 200කි. මෙලෙස දිගින් දිගටම රජයේ හමුදා එල්ල කරන ප්‍රහාර හේතුවෙන් මිනී කඳු ගොඩගැසෙද්දී 'නිදහස් සිරියානු හමුදාව' ද ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ඩැමැස්කස් අගනුවර බලය ඇල්ලීමට ප්‍රයත්න දැරුවේය. ජූලි 18දා ඩැමැස්කස්හි පිහිටි සිරියාවේ ජාතික ආරක්ෂක මූලස්ථානයට එල්ල කෙරුණු ප්‍රහාරය නිදහස් සිරියානු හමුදාව එතෙක් එල්ල කළ ප්‍රහාර අතරින් සාර්ථකම ප්‍රහාරය විය. සිරියා ආරක්ෂක ඇමැති ඩවුඩ් රාජා, නියෝජ්‍ය ආරක්ෂක ඇමැති අසෙෆ්, අභ්‍යයන්තර කටයුතු ඇමැති මොහමඩ් අල් සාර්, ජාතික ආරක්ෂක ප්‍රධානි ජෙනරාල් හිසාම් ඉත්තියාර්, ආරක්ෂක උපදේශක ජෙනරාල් හසන් එම ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත්වූ පිරිස අතර වූහ.

එසේ වුවද කැරලිකරුවන්ට රජයේ හමුදා පරාජය කර රටේ පාලන බලය අල්ලා ගැනීමට අවස්ථාවක් නොලැබිණ. සටන් උග්‍රවීමත් සමඟ සාම නිරීක්ෂකයන්ටද ප්‍රහාර එල්ල වන්නට පටන් ගත්තේය. ජුනි 06 වෙනිදා අල්-කුබේර්හි සිදුවූ සමූල ඝාතන සිද්ධිය නිරීක්ෂණය සඳහා එහි ගිය එක්සත් ජාතීන්ගේ නිරීක්ෂක කණ්ඩායමටද බර අවි ප්‍රහාරයක් එල්ල වූ අතර ඔවුන්ගේ ජීවිත බේරුණේ අනූනවයෙනි. මෙම ප්‍රහාරය කවර පාර්ශ්වයක් වෙතින් එල්ල වූයේද යන්න පැහැදිලි නැතත් බර අවි යොදාගනිමින් සිවිල් ප්‍රදේශවෙත ප්‍රහාර එල්ල කිරීම් සිදුකරන්ෙන් ජනපති අසාද්ට පක්ෂපාතී ප්‍රහාරක කණ්ඩායම් සහ ඔහුගේ අණ පිළිපදින රජයේ හමුදාවන්ය යන්න රහසක් නොවීය. සිය නිරීක්ෂණ කටයුතුවලින් ඉවත් වූ ජාත්‍යයන්තර නිරීක්ෂකයෝ සිරියාවෙන් පිටවූයේ ඉන් පසුවය.

නිරීක්ෂණ කණ්ඩායමේ ප්‍රධානි ජෙනරල් රොබට් මූඩ් සමඟ ජිනීවා නුවරදී මාධ්‍ය හමුවක් අමතමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහලේකම් කොෆි අනන් කියා සිටියේ සිරියාවේ සිවිල් යුද්ධයක් හටගෙන ඇති බවයි. පසුව කොෆි අනන්ද සිය තනතුරෙන් ඉල්ලා අස්විය.

ඒත් සමඟම එතෙක් සිරියාවේ අර්බුධය අරඹයා සිදුවූ සියලු ජාත්‍යන්තර මැදිහත්වීම් නිල වශයෙන් අවසන් විය.

අරාබි වසන්තයට ගොදුරුවූ සෙසු රටවල් සමඟ සැසඳීමේදී සිරියාවට අත්වෙන්නට යන ඉරණම විශේෂිත එකකි. එහි හැඩතල කවරාකාරවේදැයි සිතාගැනීම පවා මේ වන විට දුෂ්කර අඩියකට පත්ව තිබේ.

■

## 2012 අගෝස්තු

දිනපොත

08. පාකිස්ථානයේ නව අගමැති රාජා පර්වේෂ් අෂ්රෆ්ට 27දා අධිකරණය හමුවේ පෙනී සිටින්නැයි එරට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරයි. පාකිස්ථාන ජනපති සර්දාරිට එරෙහි දූෂණ නඩු විභාගය ආරම්භ කරන්නැයි ස්විස්ටර්ලන්ත රජයට දැනුම්දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය කළ නියෝගය ඉටු නොකිරීම ඊට හේතුවයි. පර්වේෂ්ට පෙර අගමැති ධුරය දැරූ රාසා ගිලානිට ධුරය අහිමිවූයේ ද ජනාධිපතිවරයාට එරෙහි නඩු විභාගය ඇරඹීමට ස්විස්ටර්ලන්ත රජයට දැනුම්-දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය කළ නියෝගය නොතකා හැරීම හේතුවෙනි.

12. ඉන්දියාවේ උප ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමට පැවැත්වූ ඡන්ද විමසීමේදී ඡන්ද 490ක් ලබාගනිමින් ජයගත් හමීඩ් අන්සාරි එරට 12 වන උප ජනාධිපතිවරයා ලෙස පත්වෙයි. ඔහුගේ ප්‍රතිවාදියා වූ ජස්වන්ත් සිංට ලැබී තිබුණේ ඡන්ද 238කි.

14. එක්වදෝර තානාපති කාර්යලට කඩාවැදී 'විකිලීක්ස්' වෙබ් අඩවියේ නිර්මාතෘ ජුලියන් ඇසේන්ජ් අත්අඩංගුවට ගන්නා බව බ්‍රිතාන්‍ය රජය ප්‍රකාශ කරයි. ඇමරිකානු යුද රහස් ලියැවිලි දහස් ගණනක් සිය වෙබ් අඩවිය ඔස්සේ හෙළිදරව් කළ ඇසේන්ජ් එක්ව-දෝරයේ දේශපාලන රැකවරණ ලැබ මාසයක පමණ කාලයක් රැඳී සිටින්නේ බ්‍රිතාන්‍යයේ එක්වදෝර තානාපති කාර්යාලයයේය.

16. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සිරියාව තුළ සිදුකරගෙන ආ සාම නිරීක්ෂණ කටයුතු අත්හිටුවයි. සිරියාවේ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා දිනෙන් දින ඉහළ යාමත් එරටට සාම සැළැස්මක් හඳුන්වාදීමට ගත් සියලු ක්‍රියාමාර්ග අසාර්ථකවීමත් හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සිරියාවේ විශේෂ සාම නියෝජිත ලෙස පත්කරනු ලැබ සිටි කොෆි අනන් මීට පෙර ධුරයෙන් ඉල්ලා අස්විය.

19. යේමනයේ ඒඩන් නුවර පිහිටි එරට බුද්ධි අංශ මූලස්ථානයට එල්ල කෙරුණු අල්-ක්වයිදා ප්‍රහාරයකින් ආරක්ෂක අංශ සාමාජිකයන් 18දෙනෙකු ජීවිතක්ෂයට පත්වේ.

21. මියන්මාරයේ වසර 48ක් තිස්සේ ක්‍රියාත්මක වූ මාධ්‍ය වාරණය නව සිවිල් පාලනය විසින් ඉවත් කරනු ලබයි. මියන්මාරය හමුදා පාලනයකට ගොදුරුවීමෙන් පසු 1964 සිට ඇරඹි මාධ්‍ය වාරණය අනුව සියලු පුවත් සහ මාධ්‍ය වාර්තා පළ කිරීමට පෙර වාරණ මණ්ඩලයකට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු විය.

26. ජනාධිපති සර්දාරිට එරෙහි දූෂණ චෝදනා විභාගය ආරම්භ කරන ලෙස ස්විස්ටර්ලන්ත රජයට දැනුම් දීම සඳහා පාකිස්ථාන අගමැතිවරයාට තවත් සති දෙකක කාලයක් ලබාදීමට එරට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරයි.

30. නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ රාජ්‍ය නායක සමුළුව ඉරානයේ දී ඇරඹේ. සිව් දිනකට පෙර ටෙහෙරාන් නුවරදී ඇරඹි නොබැඳි සමුළුවට ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල විරෝධය නොතකා පැමිණ සිටි රටවල් පනහක පමණ රාජ්‍ය නායකයෝ මීට සහභාගිවූහ.